# 13 බුදු දහමින් රට පාලනය කළ සක්විති රජතුමා

මෞර්ය රාජ වංශය අප බුදුරජාණන් වහන්සේගේ පිරිනිවනින් සියවස් දෙකකට පසු අවධියේ දඹදිව ඉතා දීප්තිමත් ව බැබලුණු රජ පරපුරකි.එහි ආරම්භකයා චන්ද්‍ර ගුප්ත රජතුමා ය. එතුමා චාණක්‍ය හෙවත් කෞටිල්‍ය බමුණු පඬිතුමාගේ උපදෙස් පරිදි එතෙක් රජකළ නන්ද රජපරපුර පරදවා, දඹදිව බලවත් ම රජු බවට පත් විය. පාටලී පුත්‍රය පළමු වරට අගනුවර කරගත් එතුමා සුවිසි වසක් රජකම් කළේ ය.

චන්ද්‍ර ගුප්ත රජු ඇවෑමෙන් ඔහු පුත් බින්දුසාර කුමරු රජ විය. ඔහුට බිසෝවරු සොළොස් දෙනෙක් වූහ. ඔහුට දව ඒ සියලු දෙනාට උපන් පුත්තු ම එක්සිය එක් දෙනෙක් සිටි බව කියති. ඒ අතුරෙන් ධර්මා දේවියට සුසීම, අශෝක, තිස්ස යනුවෙන් පුත්තු තිදෙනෙක් වූහ. මේ අතුරින් අශෝක කුමරු අනෙක් කුමරුන් සිය දෙනාට ම වඩා බුද්ධිමත් ය, එඩිතර ය, රණකාමී ය. ඒ නිසා ම එවකට අවන්ති දේශයේ උදේනි පුර ඇති වූ කැරැල්ලක් මැඩලීමට පැවරුණේ අශෝක කුමරුට ය. කැරැල්ල සාර්ථක ව මැඩලීම ගැන සතුටට පත් රජතුමා ඔහුට අවන්ති දේශයේ පාලනය පවරා යුව රජකම ද දුන්නේ ය.

අටවිසි අවුරුද්දක් රජකම් කළ බින්දුසාර රජතුමා මිය පරලොව ගිය කල්හි අශෝක යුව රජු රාජ්‍ය ලබා ගැනීමට පාටලී පුත්‍රයාට පැමිණියේ ය. එහෙත් සියලු සොහොහුරෝ ඔහුට එරෙහිව සිටියෝ ය. ඒ නිසා පළමු කොට ඔවුන් සමග යුද වැදීමට අශෝක යුව රජුට සිදුවිය. අන්තිමේ දී තමාගේ එක කුස උපන් වැඩිමහල් සොයුරු සුසීම කුමරු හැර සෙහොයුරන් අනූ නව දෙනෙකු ම නසා දැමූ බව කියති. කෙසේ හෝ අශෝක යුවරජු ඔවුන් ගෙන් රාජ්‍ය අත්පත් කර ගත්තේය. මේ නපුරු ප්‍රචණ්ඩ කම නිසා එතැන් පටන් ඔහුට චණ්ඩාශෝක යන අන්වර්ථ නාමයක් පටබැඳුණි.

රජවරුන් යුද්ධ කොට අවට ප්‍රදේශ හෝ රටවල් යටත් කර ගැනීම **දිග් විජය** නමින් හැඳින්වේ.

චන්ද්‍ර ගුප්ත රජතුමා දිග් විජය කොට දඹදිවින් විශාල කොටසක් යටත් කරගෙන තිබුණි. බින්දුසාර රජතුමා එය තවත් පුළුල් කළේ ය. අශෝක රජතුමා ද රජ වී නොබෝ කලකින් ඉතිරි ප්‍රදේශ යටත් කර ගැනීම පිණිස දිග් විජය ඇරඹීය. බොහෝ ප්‍රදේශ පහසුවෙන් යටත් කර ගත හැකි වුවත් කාළිංග දේශය දිනා ගැනීම අසීරු කටයුත්තක් විය. රාජාභිෂේකයෙන් අටවැනි වර්ෂයේදී හෙතෙම කාළිංගය සමග යුද වැදුණි. අති ශූර රණකාමියෙකු වූ අශෝක රජුගේ අවසාන සටන එයයි. එහිදී එක්ලක්ෂ පනස් දහසක් පමණ සිර කරුවන් වශයෙන් අල්ලා ගැනුණි. ලක්ෂයක් පමණ මරා දැමුණි. තවත් ලක්ෂයකට අධික සංඛ්‍යාවක් තුවාල ලැබූ බව **කාළිංග ලිපියේ** සඳහන් වේ.

යුද්ධයෙන් අශෝක රජු ජය ලැබී ය. එහෙත් එතුමාට එයින් මහා කණස්සල්ලක් මිස සතුටක් ඇති නොවී ය. කිසිම ආගමකට දහමකට හෝ උපදේශකයෙකුට එතුමාගේ සිත් තැවුල් සන්සිඳුවීමට නොහැකි විය. අන්තිමේදී එතුමාට සැනසිල්ලක් ඇති වූයේ නිග්‍රෝධ නම් හත් හැවිරිදි බෞද්ධ සාමණේරයන් වහන්සේගේ සංසුන් ඉරියව් දැකීමෙනි. උන් වහන්සේ මාලිගයට වැඩමවා බණ අසා පැහැදුණු රජතුමා තිසරණ පන්සිල් සමාදන් ව බෞද්ධ උපාසකයෙකු බවට පත් විය.

එතැන් සිට එතුමා දිග් විජය සදහට ම අත් හැරියේ ය. ධර්ම විජය ආරම්භ කළේය. යුද කොට රටවල දිනා ගැනීම වෙනුවට සුහද ධර්ම දූතයන්ගේ මාර්ගයෙන් පිට රටියන්ගේ සිත් දිනා ගැනීමට වෑයම් කළේ ය.

දැන් එතුමා, අශෝක හෝ චණ්ඩාශෝක නොව ධර්මාශෝක ය, ගිරිනාර් ලිපියේ සඳහන් වන පරිදි ''**නාස්ති හි කම්මතරං සව් ලෝක හිතාය**'' ( සියලු ලෝ වැසියන්ගේ යහපත පිණිස වැඩ කිරීම තරම් ලොකු වැඩක් වෙන නැත) ''**සවෙ මුනිසෙ පජා මම**'' (සියලු මිනිස්සු මගේ දරුවෝ ය ) යනුවෙන් එතුමා ලියා තිබේ. ඒ අනුව මුළු ලෝකය ම තමාගේ නිවස ලෙසත්, මුලු මිනිස් වර්ගයා ම තමාගේ දරුවන් ලෙසත් සැලකූ එතුමා සමාන වන්නේ සක්විති රජ කෙනෙකුට ය. එතුමා මුව දඩයම වැනි හිංසා කාරි විනෝද ගමන් අත් හළේ ය. වන්දනා ගමන් යාම, ජනපද වැසියන් බලන්නට යාම, දන් දීම වැනි ධර්ම යාත්‍රාවල යෙදුණි.

නියම බෞද්ධයෙකු වූ අශෝක රජතුමාගේ ශ්‍රේෂ්ඨතම ගුණයක් නම් බෞද්ධයන්ට මෙන් ම අනෙක් සියලු ම ආගමිකයන්ට උසස් ලෙස ගරු සරු දැක්විම යි. අන්‍යාගාමිකයන්ට සැලකූ තරමට තම ආගම ගෞරවයට පාත්‍ර වන බවත්, අන්‍යාගමිකයන්ට නොසැලකූ තරමට තම ආගම අගෞරවයට පත් වන බවත් එතුමා විශ්වාස කළේය. වෙනත් රජවරු සෙල්ලිපිවලින් කළේ තමාගේ ලොකුකම තමා ම ලියවා ගැනිම යි. තමන්ගේ හපන් කම් ගැන ලියා තැබිම යි. එහෙත් අශෝක රජතුමා සෙල්ලිපිවල ලියා තැබුවේ ලෝකයාගේ යහපත සඳහා අවශ්‍ය වන අවවාද, අනුශාසනා, උපදෙස් පමණි.

අශෝක රජතුමා ළිං පොකුණු තැනවීය. උයන්, බෙහෙත් වතු වගා කරවීය. මහණ බමුණන් දහස් ගනණකට දිනපතා දන් දුන්නේ ය. උපාසක ජීවිතයක් ගත කළ එතුමා සතුන්ට අභය දානය දුන්නේ ය. රජ ගෙදර ආහාරය සඳහා සතුන් මැරිම ක්‍රමයෙන් අඩු කොට අන්තිමේදි නිර්මාංශ ආහාරයට පුරුදු විය. යාග හෝම සඳහා සතුන් මැරිම සීමා කළේ ය. පොහොය දිනවල දඩයම හා මස් මාළු විකිණිම තහනම් කළේ ය.

අශෝක රජු තම රට වැසියාට හොඳින් ආගමික නිදහස දුන්නේ ය. බුදුදහමේ සහ වෙනත් ආගම්වල එන වැදගත් කරුණු ගල් ටැම්වල ලියවා ප්‍රසිද්ධ ස්ථානවල සිටු විය. ඒවා අශෝක ධර්මය, උපාසක ධර්මය යැයි ද හැඳින්වේ. එතුමාගේ ධර්ම ලිපිවල, සිගාලෝවාද, මංගල, රාහුලෝවාද ආදි සූත්‍රවල කරුණු සටහන් කර තිබේ. ධනය පරිහරණය කරන හැටි, මව්පිය උපස්ථානය, මහණ බමුණන්ට සැලකීම, ගුරු ගෞරවය හා ගුරුන්ට කීකරු වීම, දාසි දස් කම්කරුවන්ට සලකන හැටි ආදී බොහෝ කරුණු එතුමාගේ ගිරි ලිපි හා ටැම් ලිපිවල සඳහන් ව තිබේ.

අශෝක රජතුමා ධර්මප්‍රචාරය සඳහාත් රට වැස්සන් ධර්මානුකූල ජීවිතය හුරු කිරිමටත් වෙනම දෙපාර්තමේන්තුවක් පිහිටු වීය එහි නිළධාරි මණ්ඩලය හැඳින්වුණේ ධර්ම මහාමාත්‍ර නමිනි. ඔවුන්ට තිබුණු රාජකාරිය නම් ඕනෑම ආගමක ඕනෑම පන්තියක ජනයාට පමණක් නොව රජ පවුලේ අයට පවා ධර්මය පිළිබඳ දැනුමක් ලබා දීම යි.

බෞද්ධ ධර්මයේ අසූ හාරදහසක් ධර්මස්කන්ධ සිහිවීම සඳහා ගම් නියම් ගමවල අසූ හාර දහසක් වෙහෙර විහාර ඉදි කරවන ලදි. එයින්

අගනුවර වූ පාටලි පුත්‍රයේ ඉදි කළ ප්‍රධාන ආරාමය අශෝකාරාමය නම් විය. නිතර වන්දනා චාරිකවේ ගිය එතුමා බුදු උපත සිදු වූ ලුම්බිණියය, බුදු වූ බුද්ධගයාව, දම්සක් දෙසූ සාරානාත්හි ඉසිපතනය, පිරිනිවන් පා වාදළ කුසිනාරාව යන ස්ථානවල එම සිදු වීම් සටහන් කොට ගල් ටැම් පිහිටුවා ආරාක්ෂාව ද සැලසීය .අදත් ඒ තැන්වල එම ටැම් ලිපි දක්නට ලැබේ.

අශෝක රජතුමා බෞද්ධයකු වූ පසු අනෙක් ආගමිකයන්ට වඩා භික්ෂු සංඝයාට ලැබෙන පහසුකම් වැඩි විය. මේ නිසා වෙනත් ආගමිකයෝ සිවුරු පොරවාගෙන භික්ෂුන්වහන්සේ ලා ලෙස පෙනී සිටින්නට පටන් ගත්හ. මෙයින් භික්ෂුන් වහන්සේලාට එකතු වී පොහොය කිරීම වැනි විනය කර්ම කිරීමට නොහැකි විය. රජ මාලිගයේ නිතර භික්ෂුන් වහන්සේ නමක් වැඩමවා ධර්ම දේශනා කිරීමේ සිරිතක් තිබුණි. එසේ ධර්ම දේශනාවලට යන නිකම් සිවුරු පොරවාගත් අන්‍ය ආගමිකයෝ තමන්ගේ අදහස් බුදුදහම ලෙස දේශනා කරන්නට වූහ. ධර්ම දේශනාවල මේ පරස්පරය රජතුමාට දැනිණි. එයට හේතුව කුමක් දැයි රජතුමා එවකට සංඝයා අතර ප්‍රධානත්වය ඉසිලූ මොග්ගලි පුත්තතිස්ස තෙරුන්ගෙන් විමසී ය. එවිට උන්වහන්සේ අන්‍ය තීරථකයන්ගෙන් වන හානිය හෙළි කළහ. ඒ අනුව ක්‍රියාත්මක වූ රජතුමා ඒ අන්‍යාගාමික භික්ෂුන් හැට දහසක් රාජ නියෝගයෙන් සසුනෙන් නෙරපා දැම්මේ ය.

අසූ හාර දහසක් වෙහෙර විහාර ඉදිකළ අශෝක රජතුමා තමා දැන් සාසනයේ හිමි කරුවෙක් දැයි මොග්ගලීපුත්තතිස්ස තෙරුන්ගෙන් විමසී ය. එවිට ''මහරජ, තවම නැතැ"යි උන්වහන්සේ වදාළහ. එසේ නම් සාසනයේ හිමිකරුවෙකු වන්නේ කෙසේදැයි රජු විමසීය. ඒ සඳහා තම දරුවෙකු පැවිදි කළ යුතු යැයි උන්වහන්සේ පැවසූහ. දරුවකු පැවිදි කිරීමේ ආශාව උපන් රජතුමා. තමා අසල සිටි මහින්ද කුමරු දෙස බැලීය. පිය රජු විමසන්නටත් පෙර '' මම පැවිදි වෙමි'' යි කියා කුමරු ඉදිරිපත් විය. මහින්ද කුමරු රජුගේ අවසරයෙන් මොග්ගලි පුත්ත තිස්ස තෙරුන් වෙත පැවිදිව පසුව රහත් විය. උන්වහන්සේගේ එක කුස උපන් සොහොයුරියක වූ සංඝමිත්තා කුමරිය ද පියාගෙන් අවසර ගෙන මෙහෙණි සාසනෙහි පැවිදිව රහත් වුවා ය. මේ දෙදෙනා ම අශෝක රජු රජ වන්නට පෙර පාලනය කළ අවන්ති දේශයේ දී ආවාහ කරගෙන සිටි වේදිස දේවියගේ දරුවෝ ය.

අන්‍ය තීර්ථකයන් විසින් ධර්මය විකෘති කිරීම නිසා සැබෑ ධර්මය ඉස්මතු කර ගැනීමට සංගායනාවක් පැවැත් වීම අවශ්‍ය විය. මේ බව මොග්ගලි පුත්ත තිස්ස තෙරණුවෝ රජතුමාට දැන්වූහ. රජතුමා ඉතා කැමැත්තෙන් ඉදිරිපත් විය. එතුමාගේ පූර්ණ දයකත්වයෙන් පැළලුප් නුවර අශෝක රාමයේදී ධර්ම සංගායනාව පැවැත් වුණි. එයට දහසක් රහතන් වහන්සේලා සහභාගී වූහ. තුන්වන ධර්ම සංගායනාව නමින් හැඳින්වෙන්නේ එය යි.

සංගායනාවෙන් පසු අවට රටවල්වලට ධර්මය බෙදා දෙන්නට රජතුමා තීරණය කළේ ය. ඒ අනුව රටවල් නවයක් තෝරාගෙන ඒවාට විශේෂ ධර්ම දූත කණ්ඩායම් පිටත් කර යවන ලදි. ශ්‍රී ලංකාව ද එයින් එකකි. අනාගතයේදි බුදු සසුන ඉතිරි වන්නේ ලංකාවේ බව බුදුරජාණන් වහන්සේ ශක්‍ර දේවේන්ද්‍රයා ට වදාරා තිබිණි. මේ බව මොග්ගලි පුත්ත තිස්ස තෙරුණුවෝත් අශෝක රජතුමාත් දැන සිටිය හ. එනිසා රටවල් නවයට ම යැවූ පිරිස්වලට වඩා සුවිශේෂ රාජකීය දූත පිරිසක් ලංකාවට එවන ලදී. මිහිඳු හිමියන් රජතුමා ගේ පුත්‍රයා ය. භණ්ඩුක උපාසක තුමා බෑණා ය. සුමන සාමණේරයන් වහන්සේ මුණුබුරා ය. මෙරට මෙහෙණි සස්න ආරම්භ කරන්නට උවමනා යැයි දැන්වූ විට ඒ සඳහා එවන ලද්දේ ද තමාගේ ම දියණිය වූ සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ය. ඒ සමග විශේෂ පූජනීය වස්තුවක් ලෙස අදත් වැජඹෙන ශ්‍රී මහා බෝධීන් වහන්සේ ද අශෝක රජතුමා ලංකාවට ප්‍රදානය කළේ ය.

මෙසේ ධර්මාශෝක රජතුමා බුද්ධාගම ලෝක ආගමක් බවට, ජාත්‍යන්තර ආගමක් බවට පත් කළේ ය. තව ද ජයග්‍රහණයේ හිණිපෙත්තට පැමිණ දිග්විජය අත්හළ, ලෝක ඉතිහාසයේ එකම රණ ශූරයා ලෙස ද, බුදු දහම ලොව පතුරුවාලීමේ පුරෝගාමියා ලෙස ද ධර්මාශෝක රජතුමා ඉතිහාසයේ බබළන්නේ ය.

**අභ්‍යාස**

01. ධර්මාශෝක රජතුමා බුදු සසුනට කළ මෙහෙවර ලැයිස්තුවක් ලෙස පිළියෙල කරන්න.

02. බුදු සසුනේ දියුණුවට වැඩ කළ වෙනත් රජවරු පස් දෙනෙකු නම් කොට ඔවුන් කළ මෙහෙවර සැකෙවින් සඳහන් කරන්න.